# ගම් පෙරළියක් නොවූ ගම්පෙරළිය

ගම්පෙරළියෙන් අවුරුදු හැටකටත් වැඩි කාලයකින් පසුවත් ඒ ඉක්මවා යන සිංහල නවකතාවක් බිහි නොවී යැයි ඇතැම්හු පවසති. මේ කියමන සත්‍යයක් ද නැත් ද යන්න මට කිව නොහැක්කේ මා ඉන්පසු නිකුත් වූ සිංහල නවකතා බොහෝමයක් කියවා නොමැති බැවිනි. ඒ කෙසේ වුවත් ගම්පෙරළිය උසස් නවකතාවක් නොව බටහිර සමාජපෙරළි ප්‍රවාදවලට අනුව ලියැවුණු කල්පිතයක් බව සඳහන්කළ යුතු ය. මෙයින් අදහස් කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බලපෑම හමුවේ ලංකාවේ ගම් වෙනස් නොවූ බව නො වේ. එහෙත් නිදහස් අධ්‍යාපනය ඔස්සේ උසස් පෙළ (සරසවි පිවිසුම්) අධ්‍යාපනය ගමට යනතෙක්ම සිංහල ගම් වෙනස්වූවා නම් ඒ ඉතා මඳ වශයෙනි.

අනෙක් අතට ගම වෙනස්වීම ඉතා සුළුවෙන් සිදුවිණි ද ගමේ පරිපාලන රටාව බ්‍රිතානීන් විසින් වෙනස්කර තිබිණි. සාමාන්‍ය මිනිසුන් අතර සම්බන්ධකම් එතරම් වෙනස් නොවුණ ද ගමේ සාමූහිකත්වය එලෙසම තිබුණ ද අත්කම් ක්‍රමයෙහි වෙනසක් නොවුණ ද, මුහන්දිරම්ලා, විදානෙලා, ඔපිසරලා ආදී වශයෙන් ප්‍රභූ පිරිසක් ඇතිකිරීමට විසිවැනි සියවසේ දෙවැනි කාර්තුව වන විට බ්‍රිතානීන් සමත් වී තිබුණි. හම්පෙරළියේ නිරූපණයවන්නේ මොවුන්ගේ ජීවිතය හා සාමාන්‍ය ජනයාගේ ජීවිතය යැයි මාර්ටින් වික්‍රමසිංහ මහතා සිතූ සිද්ධිමාලාවකි.

මුහන්දිරම්ලා විදානෙලා ඔපිසරලා (මේ සියල්ලෝම බ්‍රිතානීන් විසින් පත්කරන ලද පහළ මට්ටමේ නිලධාරීහු වූහ.) සිංහල සමාජයෙහි තිබූ තනතුරුලාභීහු නොවූහ. රාජකාරි ක්‍රමය කෝල්බෲක් කැමරන් යෝජනාවලින් (ඒ ප්‍රතිසංස්කරණ නොව බ්‍රිතානි සමාජ ක්‍රමය අප මත බලෙන් පැටවීමට යොදාගත් සිංහල විරෝධී යෝජනාවලියක් විය.) අහෝසිකර තිබුණි. රාජකාරි ක්‍රමයේ රාජපුරුෂයන් නිලමෙලා අදිකාරම්ලා ආදීන් වෙනුවට බ්‍රිතානීන් විසින් ලේකම්වරුන් දිසාපතිවරුන් උපදිසාපතිවරුන් ආදායම් පාලක නිලධාරීන් ආදීන් පත්කර තිබුණි. මුහන්දිරම්ලා ආදීහු මේ ධුරාවලියෙහි පහළ මට්ටමේ අය වූහ. මේ අය සිංහල සමාජ ක්‍රමයෙන් මුළුමනින් ම කැඩී නොගිය නමුදු ඔවුන්ගේ පුත්තු නගරයේ පාසල්වල අධ්‍යාපනය ලැබූහ. වික්‍රමසිංහ මහතා ද එලෙස අධ්‍යාපනය ලැබුවෙක් විය. ගම්පෙරළියෙහි තිස්ස ද එවැන්නෙකි.

මේ පහළ නිලධාරීහු ගම්වල ප්‍රභූවරු වූහ. ඔවුන්ගේ දරුවන් සාමාන්‍ය මිනිසුන්ගේ දරුවන් සමග සෙල්ලම්කරන්නට ඇත. එහෙත් ආවාහ විවාහ කර නොගත්හ. දරුවෝ සාර්ථක අධ්‍යාපනයක් ලැබී නම් මුලදීම කොළඹ පාසලක ශිෂ්‍යත්වයක් හිමිකරගත්හ. එසේ නැත්නම් පසුව 1921 දී ඇතිකරන ලද විශ්වවිද්‍යාල ආයතනයටත් 1942 දී ඇතිකරන ලද ලංකා විශ්වවිද්‍යාලයටත් ඇතුල් වී තවදුරටත් බටහිර අධ්‍යාපනය ලැබූහ. ඔවුන්ගෙන් සමහරෙක් ඉහත සඳහන් ධුරාවලියෙහි ඉහළ තනතුරුවලට පැනගත්හ. ගම්පෙරළියට පසුබිම් වන කාල පරිච්ඡේදයෙහි විශ්වවිද්‍යාල ආයතනය තිබිණි යැයි සිතිය හැකි ය.

ගම්වල එකල සිටියේ සාමාන්‍ය මිනිසුන් හා මේ පහළ නිලධාරීන් පමණක් නො වේ. සිංහල ගුරුවරුන් හා භික්ෂූන් වහන්සේ ද එකලත් ගම්වල දැකගත හැකි විය. සිංහල ගුරුවරු ද සිංහලෙන් බ්‍රිතානි අධ්‍යාපනයෙහි ප්‍රාථමික හා පශ්චාත් ප්‍රාථමික කොටස් ගමට ගෙනයෑමට යොදාගනු ලැබූහ. උදාහරණයක් ලෙස ගතහොත් බටහිර වෛද්‍ය විද්‍යාවෙහි ඉතා ප්‍රාථමික කොටසක් සෞඛ්‍යය (ස්වස්ථතාව) යන විෂය යටතේ ගමට ගෙන යෑමට බ්‍රිතානීහු සිංහල ගුරුවරුන් යොදාගත්හ. එමගින් දේශීය වෙදකම අවිද්‍යාත්මක කිරීමේ පළමු පියවර ගැනිණි.

එහෙත් සිංහල මාධ්‍යයෙන් දෙනු ලැබූ අධ්‍යාපනයෙන් බ්‍රිතානීන් බලාපොරොත්තු වූ තරමට ම බ්‍රිතානි අධ්‍යාපනය ගමට නො ගියේ ය. එයට ප්‍රධාන හේතුවක් වූයේ බ්‍රිතානි අධ්‍යාපනයේ හරය සිසුන්ට ලැබෙන්නේ සරසවි පිවිසුම් පෙළෙහි (අද නම් උසස් පෙළෙහි) දී වීම ය. සරසවි පිවිසුම් පෙළෙහි හා සරසවිවල අධ්‍යාපනය ඉංගිරිසි මාධ්‍යයෙන් කෙරෙන තෙක් හා සරසවි පිවිසුම් පෙළ පංති සහිත පාසල් නගරවලට සීමාවන තෙක් ගම්වල වෙනස්වීම (ගම්පෙරළිය) ඉතා සුළුවෙන් සිදුවිය. ගම්වල බ්‍රිතානි අධ්‍යාපනය ජ්‍යෙෂ්ඨ පංතියෙන් (සාමාන්‍ය පෙළෙන්) අවසන් විය. අධ්‍යාපනය ඔස්සේ ගම වෙනස්කිරීමට බ්‍රිතානීන්ට නොහැකි වූ එක් හේතුවක් වූයේ එය ය.

© Prof. Nalin De Silva

එහි දී තවත් හේතුවක් බලපැවේ ය. අනාදිමත් කාලයක සිට සිංහලයාගේ (සිංහල බෞද්ධයාගේ) ගුරුවරුන් වූයේ භික්ෂුන් වහන්සේ ය. භික්ෂුන් වහන්සේගේ අධ්‍යාපනය දහනවවැනි සියවසේ තුන්වැනි කාර්තුවෙන් පසුව ප්‍රබල පිරිවෙන් දෙකක් බවට පත්වූ විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් මුල්කරගෙන කෙරිණි. එහි දැනුම නිර්මාණයක් නොවුණ ද පස්වැනි සියවසේ සිට මෙරට පැවති සිංහල බෞද්ධ අධ්‍යාපනය හා දැනුම දැඩිව ආරක්ෂා කිරීමක් ඉන් සිදුවිය. පිරිවෙන් පද්ධතියක් ලංකාව පුරා ඇතිවිණි. එහි ප්‍රතිඵලය වූයේ බ්‍රිතානි අධ්‍යාපනයෙන් දූෂිත නොවූ පිරිසක් ලංකාව පුරා ගුරුවරුන් සේ කටයුතුකිරීම ය.

ඒ සමගම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ දරුවනට කියවීමට තරම් පොත් පැරැන්නන් විසින් ලියැවී තිබුණි. ඉංගිරිසියෙන් තිබූ පොත් පරිවර්තනය කර ඉගැන්වීමේ අවශ්‍යතාවක් නො වී ය. කෝට්ටේ යුගයේ ලියැවුණු සංදේශ කාව්‍ය මෙන් ම පොළොන්නරු දඹදෙණි යුගවල ලියූ පොතපත ද සිසුන්ට කියවීමට හැකිවිය. මේ පොත් සිංහල මාධ්‍යයෙන් ගමේ පාසල්වල ඉගෙන ගත් සිසුන්ගේ පෙළ පොත් විය. මේ පොත් ඔස්සේ හා භික්ෂුන් වහන්සේගේ බලපෑම ඔස්සේ  අධ්‍යාපනය දීම හේතුවෙන් ද  බ්‍රිතානීන්ට තම සිතැඟි පරිදි අධ්‍යාපනය ඔස්සේ ගම වෙනස් කිරීමට නො හැකි විය.

මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ගම්පෙරළියෙහි මේ එකක්වත් සඳහන් නො වෙයි. ඊනියා උසස් අධ්‍යාපනය හා පසුව ජනමාධ්‍යය (වික්‍රමසිංහ මහතාට ඒ ජනමාධ්‍ය අත්දැකීම මුළුමනින් ම ලබාගැනීමට නො හැකි විය. ගම්පෙරළිය ලියූ කාලයේ ද ගුවන්විදුලිය ගමේ ව්‍යාප්ත වී නො තිබුණි. පුවත්පතට ද තිබුණේ සීමිත සංසරණයකි. සිංහල පුවත්පත් කියවූවන්ගෙන් ඉතා විශාල පිරිසක් වූයේ භික්ෂුන් වහන්සේ සිංහල ගුරුවරු හා සිංහල වෙදමහතුන් බැවින් ඒ පුවත්පත් ඔස්සේ ඒ පිරිස්වලට අවශ්‍ය දැනුම ලබාදීමට ද සිදුවිණි) ගමට යනතෙක් ගම ඉතා සෙමින් වෙනස් විය. ගම් කඩිනමින් වෙනස්වීමට පටන් ගත්තේ උසස් පෙළ අධ්‍යාපනය හා ජනමාධ්‍ය ගමට යැමෙන් පසුව මිස ඉන් පෙර නො වේ.

මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ගම්පෙරළිය හිතළුවකට වැඩි දෙයක් නො වේ. ගම්පෙරළියෙහි භික්ෂුන් වහන්සේ දැක ගන්නට නැත. සිංහල ගුරුවරු වෙද මහත්වරු නැත. ගම වෙනස් වී නම් එතරම් පෙරළියක් ගමේ සිදු වී නම් එහි දී භික්ෂුන් වහන්සේගේ භූමිකාව කුමක්දැයි කිවයුතු ව තිබුණි. එහෙත් ගම්පෙරළියෙන් නිරූපණය වන ගමේ පන්සලක් තිබුණි ද යන්නවත් නො කියැවෙයි. පරගොඩ මල් පූජාවකට යන තරුණ තරුණියන්ගේ විනෝද ගමනකට (එය වන්දනා ගමනක් වී නම් ඒ මහළු උපාසකම්මලාට පමණක් විය.) පමණක් ගමේ ආගමික කටයුතු සීමාවීම අහම්බයකින් සිදුවිණි යැයි සිතිය හැකි නො වේ. වික්‍රමසිංහ මහතාගේ අනෙක් කෘතිවල ද භික්ෂුන් වහන්සේ හා පන්සල පෙනෙන්නට ඇත්නම් ඒ එතරම් යහපත් අයුරකින් නො වේ. ගුණදාස අමරසේකර මහතා ද තම කෘතිවල, ගමනක මුල කෘතියෙහි වුව ද, පන්සල හා භික්ෂුන් වහන්සේ ගැන එතරම් සඳහනක් නොකරයි. ඔහුට වුව ද ගුරුවරු හා වෙදමහත්වරු චරිත වන්නේ තම දෙමව්පියන් සම්බන්ධයෙන් ය. පනස්හයේ පෙරළියට මුල් වූ භික්ෂුන් වහන්සේ කිහිප දෙනකු ගැන කියවුණ ද පන්සල හා ගම අතර සම්බන්ධය ඒ මහතා අතින් ද නිරූපණය නො වෙයි. මෙරට ඉහළ පෙළේ සංස්කෘතික ලේඛකයන් දෙදෙනකු ලෙස විමල් දිසානායක මහතාගේ සම්භාවනාවට පාත්‍රවන වික්‍රමසිංහ හා අමරසේකර මහතුන් අතින් එසේ සිදුවන්නේ අප නොදන්නා සංස්කෘතියක් හා ජාතික චින්තනයක් ඔවුන් දන්නා බැවින් ද?

මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ගම්පෙරළියෙහි ගුරුවරයෙක් සිටියි. ඒ නන්දාට ඉංගිරිසි ඉගැන්වූ පියල් ය. එහෙත් ඔහු පාසලක ඉගැන්වූ ගුරුවරයකු නොව එකල, එනම් නන්දාට ඉංගිරිසි ඉගැන්වූ කාලයෙහි, කොළඹ හෝටලයකට ආහාර සැපයූ කොන්ත්‍රාත්කාර වෙළෙන්දෙක් විය. ඔහුට නන්දාට ඉංගිරිසි ඉගැන්වීමට අවස්ථාව ලැබුණේ කෙසේ ද යන්න පැහැදිලි නැත. කෙසේ වෙතත් පියල් අමාරුවෙන් ඉංගිරිසි ඉගෙන ගෙන ඇති බව පැහැදිලි ය. තම මව පොල් ලෙලි තළමින් ඉපයූ මුදලින් පියල් කෙසේ ඉංගිරිසි ඉගෙන ගත්තේ ද යන්න පැහැදිලි නැතත් ඔහු ඉංගිරිසිය ඔස්සේ කොන්ත්‍රාත්කම ද නන්දා ද ලබාගැනීමට සමත්විය.

ගම්පෙරළියෙහි සඳහන්වන්නේ බ්‍රිතානීන් විසින් ගම්වල ඇතිකරන ලද පහළ නිලධාරියකු සුළු වෙළෙන්දකු වශයෙන් ද කටයුතු කිරීමෙන් පසුව තම පවුලත් සමග ආර්ථික වශයෙන් ප්‍රපාතයට යෑම ය. ඒ අතර පොල් ලෙලි තලන ගැහැණියකගේ පුතකු වුව ද කෙසේ හෝ ඉංගිරිසි ඉගෙන ගත් පියල් කොළඹ ගොස් කොන්ත්‍රාත්කරුවකු ලෙස බටහිර ආර්ථිකය ඔස්සේ ඊනියා දියුණු තත්වයකට පත්වීම ය. කයිසාරුවත්තේ මුහන්දිරම්ගේ පුතා වූ තිස්ස ගාල්ලේ ද

© Prof. Nalin De Silva

ඉංගිරිසි අධ්‍යාපනයක් ලබා පසුව පියාගේ අගහිඟකම් හේතුවෙන් අධ්‍යාපනය දිගට ම කරගෙන යෑමට අසමත්ව පසුව කොළඹ පැමිණ බ්‍රිතාන්‍ය ආර්ථිකයෙහි ම සුළු රැකියාවක් කරන්නකු බවට පත්වෙයි.

ගම්පෙරළියෙන් පසුව වික්‍රමසිංහ මහතා යුගාන්තය නම් තවත් මනඃකල්පිත කතාවක් ද පසුව ගම්පෙරළිය හා යුගාන්තය ඈඳමින් කලියුගය නම් නවකතාව ද නිර්මාණය කෙළේ ය. තිස්ස මේ කතා තුනෙහි ම ජීවත් වෙයි. කයිසාරුවත්තේ මුහන්දිරම්ලා, මාතර හාමිනේලා, පියල්ලා, නන්දලා, තිස්සලා, ඇලන්ලා, නාලිකාලා, සවිමන් කබලානලා, එමරීලා, මාලින්ලා, දොස්තර අරවින්ද විහාරහේනලා, දිනෙත්ති රතුසේනලා ඔස්සේ අපි ගම්පෙරළියකින් පටන්ගෙන යුගාන්තයක් දකින්නෙමු ද? නැතහොත් බටහිර විචිචුරන ප්‍රවාදවලට සරිලන සේ මාර්ටින් වික්‍රමසිංහ මහතා සිංහල සමාජය කපා කොටා නිර්මාණය කළ මනඃකල්පිතයක් දකින්නෙමු ද?

මාර්ටින් වික්‍රමසිංහ මහතා මාක්ස්වාදය ගැන දැනසිටිය ද මාක්ස්වාදය අවබෝධ කරගෙන සිටි බවට සාක්ෂි නැත. ඔහු මාක්ස්වාදය හා සමාජවාදය ගැන තැනින් තැන ලියා ඇති දෙයින් පැහැදිලි වන්නේ ඔහුට මාක්ස්වාදය ගැන අවබෝධයක් නොතිබූ බව ය. මාක්ස්වාදය ගැන දැන සිටීම යන්නෙන් මාක්ස්වාදය ගැන අවබෝධයක් තිබුණු බවක් නො කියවෙයි. ගුණදාස අමරසේකර මහතාට ද ඒ කරුණු එසේ ම වලංගු වෙයි. හතළිහේ දශකයේ නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීමෙන් පසු සුළුවෙන් හා හැත්තෑවේ දශකයෙන් පසුව ඉක්මනින් වෙනස් වූ ගම් මෙරට ඇත. ඒ අතර කොළඹ ද වෙනස් වී ඇත. එහෙත් තවමත් යුගාන්තයක් පෙනෙන තෙක් මානයක නැත. කයිසාරුවත්තේ මුහන්දිරම් වෙනුවට ඔහුගේ බෑණා වූ පියල් ද පියල් වෙනුවට ඔහුගේ බෑණා වූ සවිමන් කබලාන ද පසුව රඟ පෑ නමුත් කබලානගේ බෑණා දොස්තර කෙනකුට පමණක් සීමා වී නිෂ්පාදනයක් නැතිව දැනුම විකුණන්නකු බවට පත්විය. ඒ අතර මාලින්ට කළහැකි සමාජ විප්ලවයක් ද නැතිවිය. ඔහුගේ ව්‍යායාමෙහි අවසානය කෙසේවත් යුගාන්තයක් නො වී ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva